Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 3 (3 වාරය)

විෂය:- :- ගණිතය

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 3 මිනිත්තු 20 )

## වෘත්ත

23.1 වෘත්තයක සමමිති අක්ෂ

- 6,7 ශ්‍රේණි වලදී වෘත්ත පිළිබඳව ඔබ උගත් කරුණු සිහිපත් කර ගන්න
- පෙළපොතේ (2 කොටස) 88,89 පිටු කියවා ක්‍රියාකාරකම 1 කර රූපය පොතේ අලවන්න.
- වෘත්තයක් සමාන කොටස් දෙකකට බෙදනු ලබන රේඛාවක් වෘත්තයේ සමමිති අක්ෂයක් වේ. වෘත්තයකට මෙවැනි සමමිතික අක්ෂ අපරිමිත සංඛ්‍යාවක් ඇත.වෘත්තයක සමමිති අක්ෂයක්, වෘත්තය ඡේදනය කරන ලකෂ්‍ය දෙක අතර රේඛා ඛණ්ඩය එම වෘත්තයේ විෂ්කම්භයක් ද වේ. එම සමමිති අක්ෂ ඡේදනය වූ ලක්ෂ්‍යය එම වෘත්තයේ කේන්ද්‍රය වේ.

23.2 වෘත්තයක ජ්‍යාය

- 89 පිටුව අධ්‍යයනය කර ක්‍රියාකාරකම 2 කර රූපය පොතේ අලවන්න.
- වෘත්තය මත ඕනෑම ලක්ෂ්‍ය දෙකක් යා කරන සරල රේඛා ඛණ්ඩයක් වෘත්තයේ ජ්‍යායක් ලෙස හැඳින්වේ. වෘත්තයක ජ්‍යායන් අතුරින් දිගින් වැඩිම ජ්‍යායන් වන්නේ, වෘත්තයේ විෂ්කම්භ වේ.

23.3 වෘත්ත චාප

- 90 පිටුව අධ්‍යයනය කර ක්‍රියාකාරකම 3 කර රූපය පොතේ අලවන්න.
- වෘත්ත චාප, සුළු චාපය, මහා චාපය හඳුන්වන්න.
- 90,91 පිටු වල ඇති 23.1 අභ්‍යාසය කරන්න

23.4 වෘත්ත ඛණ්ඩ හා කේන්ද්‍රික ඛණ්ඩ

- 91 පිටුව අධ්‍යයනය කර ක්‍රියාකාරකම 4 කර රූපය පොතේ අලවන්න.
- වෘත්ත ඛණ්ඩය,සුළු වෘත්ත ඛණ්ඩය, මහා වෘත්ත ඛණ්ඩය හඳුන්වන්න.
- 92 පිටුව අධ්‍යයනය කර ක්‍රියාකාරකම 5 කර රූපය පොතේ අලවන්න.
- කේන්ද්‍රික ඛණ්ඩය, කේන්ද්‍රික කෝණය හඳුන්වන්න.
- 93,94 පිටු වල ඇති 23.2 අභ්‍යාසය කරන්න
- පාඩමේ උගත් කරුණු පිළිබඳව සාරාංශයක් ලියන්න.